# 4. මිළ සහ වැටුප්

ප්‍රධාන ආහාර වර්ගවල සැපයුම් හිඟතාවය සහ පරිපාලිත මිල ගණන් සංශෝධනය කිරීම යන හේතු නිසා 2000 වර්ෂයේ මැද භාගයේ සිට 2001 අවසානය දක්වා නොකඩවා ඉහළ ගිය පාරිභෝගික මිල උද්ධමනය, සැපයුම් තත්ත්වය යහපත් අතට හැරීමත්, පරිපාලිත මිල සංශෝධනවල බලපෑම් සමනයවීමත් නිසා, 2002 ආරම්භයේ සිට ක්‍රමයෙන් පහත වැටීම ආරම්භ විය. මෑත කාලීන මිල මට්ටම්වල හැසිරීම මගින් දෙනු ලබන සංඥාව වන්නේ, 2002 අවසානය වනවිට සියයට 8 සිට 10 දක්වා පරාසයකටත්, 2003 අවසානය වනවිට සියයට 7 සිට 8 දක්වා පරාසයකටත් උද්ධමන අනුපාතය තවදුරටත් පහත බසින බවයි.

4.1 රූප සටහන
මිළ දර්ශක වල උපනතීන්




### 2002 සඳහා අපේක්ෂාව

- 2002 වර්ෂයේ ප්‍රථම භාගයේදී පාරිභෝගික මිල උද්ධමනය ප්‍රධාන වශයෙන් ඇති කරන ලද්දේ සැපයුම හා සම්බන්ධ සාධක විසින් වූ අතර, ඉල්ලුම් පාර්ශ්වය හා සම්බන්ධ ප්‍රධාන සාධකය වන මුල්‍ය ප්‍රසාරණය මේ කාලය තුල අනෙකුත් සාර්ව ආර්ථික හැසිරීම් සමග අනුගතවීම නිසා උද්ධමනයට ඉල්ලුමෙන් බලපෑමක් ඇති වූ බවට ඉදිරිපත් කල හැකි සාධක නොමැත.

- 2000 මැද භාගයේ සිට ක්‍රමයෙන් ඉහළ යමින් 2001 අග භාගයේ උපරිම මට්ටමට ඉහළ නැගුණු උද්ධමනය 2002 මුල් කාලයේ තවදුරටත් ඉහළ මට්ටමක පැවතියද එය ක්‍රමයෙන් පහත බසින නැඹුරුවක් සමඟ 2002 වර්ෂය ආරම්භ විය. අනෙකුත් පාරිභෝගික මිල දර්ශකවලට වඩා පුළුල් භූගෝලීය හා ආදායම් කාණ්ඩ ආවරණයක් ඇතිව අධ්‍යයන පදනම යටතේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මෑතදී හඳුන්වා දෙන ලද ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය ඇතුළු සියළුම පාරිභෝගික මිල දර්ශක මගින් මෙම උද්ධමනය පහළ බැසීමේ ප්‍රවණතාව පෙන්නුම් කරන ලදී.

- සැපයුම් පාර්ශ්වයෙන්, ආහාර සහ ආහාර නොවන භාණ්ඩ සමහරක නිෂ්පාදන පිරිවැය පිළිබිඹුවන ආකාරයට පරිපාලිත මිල ගණන් සංශෝධනය කිරීමත්, සමහරක් ආයාත භාණ්ඩවල මිල ගණන් වෙනස්වීමත්, මෙම වර්ෂයේ මුල් භාගයේ උද්ධමනයේ හැසිරීමට දායක විය. දේශීය කෘෂිකර්මාන්තය අර්ධ වශයෙන් යථා තත්ත්වයට පත්වීමත්, ආයාත භාණ්ඩ වෙළෙඳපොලේ පැවතීමත් පසුගිය වර්ෂයේ අනුරූප කාලයට සාපේක්ෂව ආයාත භාණ්ඩවලින් දේශීය මිල ගණන්වලට අඩු පීඩනයක් ඇතිවීමත් යන සාධක මිල මට්ටම් ඉහළයාම තරමක්දුරට අඩු කිරීමට හේතු විය. මෙම සාධකවල සමස්ත බලපෑම නිසා 2002 ජනවාරි-ජූනි දක්වා කාලච්ඡේදය අවසානයට උද්ධමනය පහළ මට්ටමකට පත් වුවද 2001 වර්ෂයේ එම කාලච්ඡේදයට සාපේක්ෂව ඉහල මට්ටමක පැවතින.

- වර්ෂය ආරම්භයේදී දක්නට ලැබුණ උද්ධමනයේ පහලයාමේ නැඹුරුව වර්ෂය පුරාම පවතියැයි අපේක්ෂා කරන අතර, ඒ අනුව පසුගිය වර්ෂයට වඩා අඩු වාර්ෂික උද්ධමනයක් මෙම වසරේදී දක්නට ලැබෙනු ඇත. කෘෂි භෝග සහ මාළු නිෂ්පාදනයේ අපේක්ෂා කරනු ලබන වර්ධනයත්, පරිපාලිත මිල ගණන්වලට මෙතෙක් අවශ්‍ය ගැලපීම් කර ඇති නිසා ඒවායෙහි සැළකිය යුතු වෙනස්වීමක් සිදු නොවීමත්, ඛණිජ තෙල් නිෂ්පාදන සඳහා ස්වයංක්‍රිය මිල තිරණය වන ක්‍රමයක් හඳුන්වාදීමත්, තිරිඟුපිටි සඳහා තිබූ සහනාධාරය ඉවත් කිරීමත්, ආයාත මිල ගණන්වලින් අපේක්ෂා කරන අඩු පීඩනයත් යන සාධක පහළ උද්ධමනයට දයක වෙතැයි අපේක්ෂා කෙරේ.

- 2002 අගෝස්තු මාසයේදී හඳුන්වාදුන් එකතු කළ අගය මත පනවන බද්දෙහි (වැට් බද්ද) ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික භාණ්ඩ පැසෙහි ඉහළ නියෝජනතාවයක් ඇති සහල්, තිරිඟුපිටි, එළවළු, මාළු, පොල් සහ සීනි යන භාණ්ඩවල මිල පහළයාමක් අපේක්ෂා කෙරේ. රජය සහ එල්ටීටීඊ සංවිධානය අතර ඇති වූ අවබෝධතා ගිවිසුමෙන් අනතුරුව කෘෂිකාර්මික හා ධීවර කටයුතුවල වර්ධනයක් මෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශවල මෙන්ම රටේ සෙසු ප්‍රදේශවලද වෙළෙඳපොලවල් අතර භාණ්ඩ හුවමාරුව වැඩි දියුණුවීම මිල මට්ටම් කෙරෙහි යහපත් අයුරින් බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ.

- 2002 වසරේ අඩු උද්ධමනයක් සඳහා පවතින අපේක්‍ෂාවන්, වසරේ දෙවන භාගයේදී යහපත් කාලගුණික තත්ත්වයක් සහ පවතින සාමකාමී වාතාවරණය ඉදිරියට පවතිය යන බලාපොරොත්තු මත පදනම් වී ඇත. වැට් බද්දෙන් ලැබිය හැකි ශුද්ධ ප්‍රතිලාභ අඩු මිල මට්ටම් මගින් නිරූපනය වනු ඇතැයි අපේක්‍ෂා කරනු ලබන අතර, කෙසේ වුවද එය තිරණය වන්නේ වෙළෙඳුන්ගේ පරාර්ථකාමී හැසිරීම, එවැනි ප්‍රතිලාභවල උපරිම ප්‍රයෝජනය ලබාගැනීම පිළිබඳව පාරිභෝගිකයන්ගේ ඇති අවබෝධය සහ පාරිභෝගික ආරක්‍ෂක විධිවිධාන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමෙහිලා ඒ ඒ අධිකාරීන්ගේ ඇති කැපවීම යන කරුණු මතයි. පවත්නා කාලගුණික තත්ත්වය පිළිබඳව සැලකිල්ල යොමු වී ඇති අතර, කලින් අපේක්ෂා කළ වර්ෂාපතනය ඇති නොවෙතැයි සිතිය හැක. එවැනි තත්ත්වයන් යටතේ විශේෂයෙන්ම කෘෂිකාර්මික අංශයේ කටයුතු අඩාල විය හැකි අතර, මිල ගණන් කලින් අපේක්ෂා කල මට්ටමට වඩා ඉහළ යා හැකිය.

- ඉහත කරුණු අනුව පෙනී යන්නේ මෙම වසරේ මිල හැසිරීම සම්බන්ධයෙන් අසාමාන්‍ය වෙනස්වීම් සිදුවිය නොහැකි බවයි. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ අතීත හැසිරීමට අනුව පුරෝකථනය කළ උද්ධමනය වර්ෂය අවසානය වනවිට සියයට 9-10 අතර පවතිනු ඇත. වැට් බද්දෙන් ලැබිය හැකි ප්‍රතිලාභ පාරිභෝගිකයා වෙත ගලා ගියහොත් උද්ධමනය සියයට 1 කින් පමණ අඩුවෙතැයි අපේක්ෂා කරන අතර, ඒ තත්ත්වය යටතේ වර්ෂාවසාන උද්ධමනය සියයට 8-9 අතර පවතිනු ඇත.

- 2001 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සේවකයන්ට ලබාදුන් වැටුප් වැඩිවීම නිසා ඔවුන් 2001 වර්ෂයට සාපේක්ෂව 2002 වර්ෂයේදී නාමික වැටුප් වැඩිවීමේ අනුපාතය පැවති උද්ධමන අනුපාතයට වඩා ඉහළ නිසා රජයේ ගුරුවරුන් ඇතුළු විධායක නොවන රජයේ සේවකයන් මූර්ත වැටුප් වැඩිවීමකට හිමිකම් ලදහ. අනික් අතට පඩිපාලක සභා යටතේ පාලනය වන ආයතනවල සේවකයන්ට උද්ධමනයට සරිලන වැටුප් වැඩිවීමක් නොලැබුනු නිසා, ඔවුන්ගේ මූර්ත වැටුප් අඩුවීමක් සිදු විය.

- ජීවන වියදම ඉහළයෑමට සමගාමීව වැටුප් මට්ටම්වල ක්‍රමික ඉහළයාමේ නැඹුරුවක් අසංවිධිත අංශයේ දක්නට ලැබේ. අසංවිධිත අංශයේ සියළුම සේවක කණ්ඩායම්වල මූල්‍ය වැටුප් ඉහළ ගියද ගොඩනැගිලි කර්මාන්තයේ හැර අනෙකුත් අංශවල වැටුප් ඉහළයාමේ වේගය උද්ධමන අනුපාතයට වඩා අඩු වූ නිසා, ඒ අංශවල මූර්ත වැටුප් අඩුවීමක් සිදු විය. සමස්තයක් ලෙස ආර්ථික ක්‍රියාකාරිත්වයේ පැවති මන්දගාමී ස්වභාවය

මේ ආකාරයේ උද්ධමනයට සරිලන පූර්ණ වැටුප් වැඩිවීමක් මගහරවා තිබෙන බව පෙනී යයි.

- 2002 වර්ෂයේ සමස්ථ වැටුප් වැඩිවීම් අවම මට්ටමක පැවතිණි. කෙසේ වෙතත්, වැවිලි අංශයේ වැටුප් ප්‍රතිශෝධනයක් සඳහා පැවති පීඩනය හමුවේ පවත්නා ආර්ථික වාතාවරණයත් සහ සේවක සුභසාධනයත් යන කරුණු සැළකිල්ලට ගනිමින් රජයේ මැදිහත්වීමකින් තොරව වැටුප් පිළිබඳ සාකච්ජාවන් සාර්ථකව සිදුකර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස වැවිලි අංශයේ සාමාන්‍ය සේවක වැටුප් රුපියල් 650 පමණ වන සියයට 21.5 කින් පමණ ඉහළ ගොස් තිබේ. එමගින් පෙනී යන්නේ සේවාදයකයන්, සේවකයන් සහ වෘත්තිය සමිති වලට තම අන්‍යෝන්‍ය ප්‍රතිලාභයන් සැළකිල්ලට ගනිමින් රජයේ මැදිහත්වීමකින් තොරව සාර්ථකව විසඳුම්වලට එළඹිය හැකි බවයි.

- වැටුප් ප්‍රතිශෝධනයන් සඳහා තරමක පීඩනයක් පැවතියද පවත්නා ආර්ථික වාතාවරණය සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය යටතේ රාජ්‍ය අංශයේ සමස්ත වැටුප් වැඩිවීමක් සිදු විය නොහැකි අතර, එවැන්නක් සිදු කිරීමද ඥානාන්විත නොවේ.

4.2 රූප සටහන
කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය
පසුගිය හැසිරීම් සහ පුරෝකථන පරාසය




## 2003 සඳහා අපේක්ෂාවන්

- අතීතයේ මෙන් මිල ගණන්වල හැසිරීම ප්‍රධාන වශයෙන්ම සැපයුම් අංශයේ සාධක මත තීරණය වනු ඇත. මූල්‍ය ප්‍රසාරණය සාර්ව ආර්ථික ස්ථායිකරණ වැඩ සටහනට සමගාමීවීම ඉල්ලුම් අංශයේ ඇතිවිය හැකි උද්ධමන පීඩනයන් සමනය කිරීමට උපකාරී වනු ඇත. වර්ෂය අවසාන වනවිට උද්ධමනය සියයට 7-8 පරාසයක වන ඒකීය අගයකට තවදුරටත් සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- දේශීය ආර්ථික කටයුතු, විශේෂයෙන්ම ආහාර නිෂ්පාදනය, ප්‍රධාන ආයාත භාණ්ඩවල, විශේෂයෙන්ම ඛණිජ තෙල්වල ජාත්‍යන්තර මිල ගණන්වල හැසිරීම, විනිමය අනුපාතය වෙනස්වීම සහ පරිපාලිත මිල සංශෝධන, 2003 වසරේ උද්ධමනය කෙරෙහි බලපානු ඇත. දේශීය වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් අසාමාන්‍ය කැළඹීමක් ඇති නොවුනහොත්, මෙම ඉහත දැක් වූ සාධකවල අසාමාන්‍ය උච්චාවචනයන් හෝ වෙනස්වීම් සිදු නොවනු ඇත.

- 2003 දී දළ දේශීය නිෂ්පාදිතය සඳහා වන පුරෝකථනයට අනුව ප්‍රධාන ආහාර භෝග නිෂ්පාදනය 2003 වර්ෂයේදී පුළුල් වෙතැයි අපේක්ෂා කෙරේ. 2003 අපේක්ෂිත වර්ධන අනුපාතයන් වන්නේ මාළු සියයට 5 යි, පොල් සියයට 3, වී සියයට 2 සහ අනෙක් කෘෂි භෝග සියයට 1 වශයෙනි. 2003 ගෙවුම් ශේෂ පුරෝකථනයන්ට අනුව, සහල්, තිරිඟු, සීනි සහ අනෙකුත් ආහාර නිෂ්පාදනවල ජාත්‍යන්තර මිල ගණන් සියයට 2 සහ 8 අතර අනුපාතයන්ගෙන් ඉහළ යාමත් අපේක්ෂා කෙරේ. විනිමය අනුපාත ස්ථාවරත්වය 2003 දී තවදුරටත් යහපත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බාහිර සාධක සම්බන්ධයෙන් අපේක්ෂිත මෙම සාධකවල සමස්ත ප්‍රතිඵලය දේශීය මිල මත පීඩනය අඩු කරනු ඇත. ඛණිජ තෙල් නිෂ්පාදන මිල තීරණය කිරීම සඳහා ස්වයංක්‍රීය මිල තීරණය වීමේ ක්‍රමයක් හඳුන්වාදීම, තිරිඟු සඳහා තිබූ සහනාධාරය ඉවත් කිරීම යටතේ, එම භාණ්ඩවල නිෂ්පාදන

පිරිවැය අලෙවි මිල මගින් නියෝජනය වන නිසා, 2003 දී පරිපාලිත මිල වෙනස්වීම් මගින් උද්ධමනයට ඇති විය හැකි බලපෑම ඉතා සුළු වනු ඇත.

- ඉහළ යන ජීවන වියදම පාලනය නොකළහොත්, දැනට තැනින් තැන දක්නට ලැබෙන වැටුප් වැඩි කිරීම් සඳහා ක්‍රියාත්මක වන බලවේග දැනට අක්‍රිය එවැනි බලවේග උනන්දු කිරීමට සහ ඒකරාශි කිරීමට යොමු විය හැකිය. කෙසේ වෙතත්, දැනට අපේක්ෂිත ආර්ථික උද්දීපනය යටතේ රැකියා අවස්ථා උත්පාදනය තුළින් සේවා වියුක්තිය අඩු කළහොත් පවුල්වල ජීවන බර දරා ගැනීමට වැඩි පිරිසකට හැකියාව ලැබෙන හෙයින්, වැටුප් වැඩිවීම සඳහා වන පීඩනය තරමක් සමනය වනු ඇත. ඵලදායිතාවයේ වර්ධනයට සමගාමීව වැටුප් වැඩිවීමක් හානිකර නොවුවද. එවැනි ඵලදායිතා වර්ධනයක් අපේක්ෂා කළ හැක්කේ ආර්ථිකයේ සියළුම අංශවල කාර්යක්ෂමතාව වැඩි වුවහොත් පමණි.

- එසේ වුවත්, 2003 දී අපේක්ෂිත උද්ධමනය පහත යෑම යටතේ වැටුප් වැඩිකිරීම සඳහා ඇතිවිය හැකි පීඩනය 2002 දී පැවති පීඩනයට වඩා අඩුවනු ඇත. එසේම කම්කරු ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමත් සමඟ ශ්‍රම වෙළෙඳපොලෙහි නම්‍යශීලිතාවය තවදුරටත් වැඩිවනු ඇති අතර, එය වැටුප් සංශෝධනයන් සඳහා වන පීඩනය තවදුරටත් සමනය කරනු ඇත.